# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස 2014

## (ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2015 නොවැම්බර්)

## BLE 101 - සූක්ෂම ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) පහත දක්වා ඇති උපදෙස් පිළිපදිමින් පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සමන්විත වේ.

(4) ප්‍රශ්න පත්‍රය පිටු තුනකි (03)

(5) ප්‍රස්ථාර කොළ සපයනු ලැබේ.

(6) උත්තර පත්‍රයේ සියළුම පිටුවල විභාග අංකය යොදන්න.

(7) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01.

i. ඉල්ලුම් න්‍යාය තීරණය වීමට බලපාන ප්‍රධාන හේතු සාධක දෙක කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 ½)

ii. නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර ගොඩනැගීමේදී භාවිතා වන ප්‍රධාන උපකල්පන තුනක් දක්වන්න.

(ලකුණු 2 ½)

iii. ආර්ථික විද්‍යාව පිළිබඳ වඩා පිළිගත හැකි නිර්වචන දෙකක් දක්වන්න.

(ලකුණු 2 ½)

iv. ප්‍රතිබද්ධ භාණ්ඩයක මිල වෙනස්වීම සලකා බලන භාණ්ඩයේ ඉල්ලුමට කරන බලපෑම ප්‍රස්ථාර ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 ½)

v. ඉල්ලුම් හා සැපයුම් ලේඛණය

| මිල (P) | ඉල්ලුම් ප්‍රමාණය(Q) | සැපයුම්ප්‍රමාණය |
|---|---|---|
| 10 | 500 | 300 |
| 20 | 450 | 400 |
| 30 | 400 | 500 |

(a) ඉහත වගුවෙහි දැක්වෙන දත්ත ඇසුරෙන් ඉල්ලුම් සමීකරණය හා සැපයුම් සමීකරණය ගොඩනගන්න.

(ලකුණු 2 ½)

(b) ඔබ විසින් නිර්මාණය කරන ලද ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ යොදාගනිමින් වෙළඳපල සමතුලිත මිල සහා ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 2 ½)

vi. මිනිස් වුවමනාවන්හි ස්වභාවය අසීමිත වන බව සුදුසු උදාහරණ සමගින් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 ½)

vii. ඉල්ලුමේ වෙනස හා ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස අදාල ප්‍රස්ථාර සටහන් උපයෝගී කරගනිමින් විස්තර කරන්න.

(ලකුණු 05)

viii. වෙළඳපලක යම් භාණ්ඩයක මිල රු. 10 දී ඉල්ලුම් ප්‍රමාණය ඒකක 500 වන අතර අධි සැපයුම් ප්‍රමාණය ඒකක - 400කි. සැපයුම් ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 2 ½)
(මුළු ලකුණු 25)

02.

i. තරඟකාරී වෙළඳපලක අලෙවි වන භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත පරිදි වේ.

Qd = 400- 16P

Qs = -200 + 44P

a. වෙළඳපල සමතුලිතය ගණනය කරන්න.

b. රජය විසින් මෙම භාණ්ඩය සඳහා රු.10ක බද්දක් පැනවූයේ නම්,

- වෙළඳපල නව සමතුලිත මිල සහ ප්‍රමාණය කොපමණද?
- බදුබර ව්‍යාපාරිකයා හා පාරිභෝගිකයා අතර බෙදී යන ආකාරය පැහැදිලි කරන්න.
- රජයේ බදු ආදායම ගණනය කර පෙන්වන්න

(ලකුණු 08)

ii. සැපයුම් ලේඛණයක් හා සැපයුම් වක්‍රයක් යොදාගනිමින් සැපයුම් න්‍යාය විස්තර කරන්න.

(ලකුණු 05)

iii. මූලයට අවතල නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක ආවස්ථික පැවැවැය වැඩෙන කල්පිත සංඛ්‍යා යොදාගනිමින් නිර්මාණය කරන ලද නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 12)
(මුළු ලකුණු 25)

03. පහත දැක්වෙන්නේ තරඟකාරී වෙළඳපලක අලෙවිවන භාණ්ඩයක් සම්බන්ධයෙන් පවතින්නාවූ ඉල්ලුම් හා සැපයුම් සමීකරණයන්ය.

P = 14 – 1/10Qd

QS = 40 + 10P

i. මිල රු. 2 සිට 9 දක්වා රු. 1 බැගින් වෙනස්වීමේදී, ඉල්ලුම් හා සැපයුම් ලේඛණයන් පිළියෙල කරන්න.

ii. ඉහත ඉල්ලුම් හා සැපයුම් සමීකරණයන් ඇසුරෙන් ඉල්ලුම් හා සැපයුම් වක්‍ර නිර්මාණය කර සමතුලිත මිල හා ප්‍රමාණය දක්වන්න.

iii. ඉහත භාණ්ඩය සඳහා රු. 2ක සහනාධාරයක් සැපයීමට රජය විසින් තීරණය කරන ලද්දේයැයි සිතන්න. සහනාධාරයේ වෙළඳපල බලපෑම විස්තර කරන්න.

iv. ඉහත භාණ්ඩය විකිණිය හැකි උපරිම මිල රු. 3ක් යැයි (සහනාධාරයට පෙර) රජය විසින් තීරණය කළේ නම්, වෙළඳපලේ ඇති විය හැකි ප්‍රතිවිපාකයන් විස්තර කරන්න.

v. සහනාධාරය වෙනුවට, මෙම භාණ්ඩය සඳහා රු. 3 ක අලෙවි බද්දක් පැනවූයේ නම්, වෙළඳපල තුල ඇතිවිය හැකි ප්‍රතිවිපාකයන් (නව සැපයුම් වක්‍රයද නිර්මාණය කරමින්) පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 5 = 25)

04.

i. පූර්ණතරඟකාරී වෙළඳපලක ලක්ෂණ කෙටියෙන් විස්තර කර, එහි නිෂ්පාදකයන් කෙටි කාලයේදී නිශ්ප්‍රමාණික ලාභ හා ප්‍රමාණික ලාභ උපයන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 10)

ii. ඒකාධිකාරී වෙළඳපලක්, ඒකාධිකාරී තරඟ වෙළඳපලකින් වෙනස් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. ඒකාධිකාරී වෙළඳපලක් ඇතිවීමට බලපාන සාධක උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 15)

05.

i. නිශ්පාදන න්‍යාය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

(ලකුණු 08)

ii. නිශ්පාදනයට අදාල වන දිගුකාලය හා කෙටි කාලය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

iii. පහත දැක්වෙන සංකල්පයන් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

- හීන වන ආන්තික ඵලදායීතා න්‍යාය
- පාරිභෝගික අතිරික්තය හා ව්‍යාපාරික අතිරික්තය

(ලකුණු 5 x 2 = 10)

(මුළු ලකුණු 25)

$P = 14 - 1/10\,Qd$

~~10~~

~~100~~

$1/10\,Qd = 14 - P$

$140 - 10P.$